# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1419/3 – 2005 නොවැම්බර් 14 වැනි සඳුදා – 2005.11.14**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 ජුනි මස 07 වන දින අංක 509/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1988 මැයි මස 27 දින දරන ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට පහත දැක්වෙන ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්. ඩී. එල්. ගුණවර්ධන,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2005 ඔක්තෝබර් මස 28 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 46, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

*ක්‍රියාත්මක වන දිනය .–* 3 වැනි වගන්තියේ සඳහන් වැටුප් පරිමාණයන් 2005.01.01 දින ක්‍රියාත්මක කිරීමට යටත්ව 1988 ජුනි මස 07 අංක 509/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1988 මැයි 27 දින දරන ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ හා *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරණ ලැබූ එම සංග්‍රහයට වරින් වර කරනු ලැබූ සංශෝධනයන් ප්‍රකාර විධිවිධානයන් අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි මෙම ව්‍යවස්ථා සංග්‍රහය 2005 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. *නිර්වචනය .–* “ ආධුනික නිලධාරියා ”යනුවෙන් අදහස් කරනුයේ මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ බඳවා ගනු ලැබ ආධුනික පුහුණුව ලබමින් සිටින පුද්ගලයෙකි.

“*ගැසට් පත්‍රය* ” යන්නෙන් අදහස් කරනුයේ *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය* වේ.

“සේවා ව්‍යවස්ථාව ”යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව වේ.

“නියමිත දිනය” යනුවෙන් අදහස් කරනුයේ මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය වේ.

"රාජ්‍ය සේවා කොමිෂන් සභාව " හෝ රා. සේ. කො. යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පත්කරනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

"අදාළ ක්ෂේත්‍රය "යනුවෙන් අදහස් කරනුයේ ලේකම් විසින් අනුම කරන ලද ක්ෂේත්‍රයක් වේ.

"ලේකම් " යනුවෙන් අදහස් කරනුයේ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් වේ.

"සේවය " යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයයි.

"ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හෝ ශ්‍රී. ලං. සං. ප. ආ " යනුවෙන් අදහස් කරනුයේ 1982 අංක 09 දරන පනත යටතේ ස්ථාපිත කොට ඇති ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වේ.

3. *ව්‍යුහය, වැටුප් පරිමාණ හා සේවක සංඛ්‍යාව .–*

(1) මෙම සේවය මෙහි පහත දැක්වෙන ඕනෑම පංතියකට පත්කරනු ලබන රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වන්නේ ය:

*විශේෂ ශ්‍රේණිය*
වාර්ෂික වැටුප් පරිමාණය රු 3,45,600 – 8 x 12,360 – රු. 4,44,480

*I වන පන්තිය*
වාර්ෂික වැටුප් පරිමාණය රු 2,76,540 – 10 x 11,880 – රු. 3,95,340

*II පන්තිය*
වාර්ෂික වැටුප් පරිමාණය රු. 2,14,980 – 10 x 7,740 – 5 x 8,580 – රු. 2,73,360

*III පන්තිය*
වාර්ෂික වැටුප් පරිමාණය රු. 1,57,500 – 15 x 3,780 –රු. 2,14,200

1 වන කාර්යක්ෂමතා කඩඉම III පන්තියේ වසර 3 ක් සම්පූර්ණ කිරීමට පෙර ;
2 වන කාර්යක්ෂමතා කඩඉම III පන්තියේ වසර 6ක් සම්පූර්ණ කිරීමට පෙර.

(2) අනුමත සේවක සංඛ්‍යාව පහත සඳහන් පරිදි විය යුතුය :

| | | | |
|---|---|---|---|
| (අ) | විශේෂ ශ්‍රේණිය | – | 200 |
| (ආ) | I පන්තිය | – | 507 |
| (ඇ) | II පන්තිය | – | 635 |
| (ඈ) | III පන්තිය | – | 1059 |

*සටහන.–* රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කලින් කලට මෙම සේවක සංඛ්‍යාව වෙනස් විය හැකිය.

(3) III වන පන්තියට කරනු ලබන බඳවා ගැනීම හැර කිසියම් පන්තියකට හෝ ශ්‍රේණියකට යම් වර්ෂයක දී පත් කළ යුතු/උසස් කළයුතු සංඛ්‍යාව වනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට හා එම වර්ෂයේ ජුනි මස 30 දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව වේ. III පන්තියට බඳවා ගැනීමේ දී යම් වර්ෂයක දී පත් කළ යුතු සංඛ්‍යාව වනුයේ එම වර්ෂයේ ජුනි 30 දිනට පැවති පුරප්පාඩු සංඛ්‍යාව වේ.

4. *පත්කිරීමේ ක්‍රමය .–* සේවයේ ඕනෑම පන්තියකට කෙරෙන පත්වීම මෙම ව්‍යවස්ථාවේ දක්වා ඇති පිළිවෙල යටතේ පමණක් සිදු කළ යුතුය.

5. *තරග විභාග මගින් III වන පන්තියට බඳවා ගැනීම්.–* III වන පන්තියට බඳවාගනු ලබන්නේ තරග විභාග මගින් පමණකි. මෙම විභාගය වාර්ෂිකව පවත්වනු ලැබේ.

(i) සේවයේ III පන්තියේ පුරප්පාඩු වලින් 80% ක් සඳහා බඳවා ගැනීම සේවා ව්‍යවස්ථාවේ ප්‍රකාර විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. මෙම විභාගය පිළිබඳ විස්තර 'අ' පරිශිෂ්ඨයේ දක්වා ඇත ;

(අ) යම් පුද්ගලයෙකුට මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට නම් ඔහු/ඇය -

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය ;

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතු ය ;

(iii) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 28 එළඹ නොසිටිය යුතු ය. ( මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට වසර 03 ක කාලයක් සඳහා මෙම වයස් සීමාව අවුරුදු 30ක් වනු ඇත) ;

(iv) විශිෂ්ඨ චරිතියකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් ද යුක්ත විය යුතු ය.

(2) සේවයේ III වන පන්තියේ පුරප්පාඩු වලින් 20% ක් සඳහා බඳවා ගැනීම සේවා ව්‍යවස්ථාවේ ප්‍රකාර විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන සීමිත තරග විභාගයක ප්‍රතිඵල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන ලැබේ. මෙම විභාගය පිළිබඳ විස්තර හා මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබන සේවාවන් පිළිබඳ විස්තර (ආ) හා (ආ1) ඇමුණුම්වල දක්වා ඇත.

(අ) යම් පුද්ගලයෙකු සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීමට නම්, ඔහු/ඇය–

(i) ආ පරිශිෂ්ඨයෙහි දක්වා ඇති ඕනෑම සේවාවක වසර 10ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය. උපාධිධාරීන් සඳහා සක්‍රීය සේවා කාලය වසර 5ක් විය යුතු ය.

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වූ පසුගිය පස් අවුරුදු කාලය තුළට ගැනෙන සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය සහ දඬුවම් නොලබා තිබිය යුතුය.

6. *සුදුසුකම් පිළිබඳ සීමා.*–

(i) සේවා ව්‍යවස්ථාවේ 5 (1) හෝ 5(2) හෝ ප්‍රකාර තරග විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තෙකුට අවසර නොමැත ;

(2) යම් ආගමික නිකායක පැවිදි වරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත ;

7. *අයදුම් කිරීමේ ක්‍රමය.*– විභාගයට පෙනී සිටීම සඳහා අයදුම්කිරීමේ ක්‍රමය රජයේ *ගැසට් පත්‍රයේ* පළකරනු ඇත.

8. *සුදුසුකම් ලබන දිනය.*– සේවයට පත් කිරීම සඳහා වන තරග විභාගවලට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු –

(1) ඉහත 5 වන ඡේදයේ සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණකි ;

(2) උපාධිය සුදුසුකමක් ලෙස අවශ්‍ය වන අවස්ථාවලදී උපාධි සහතිකයේ වලංගු දිනය අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ එදිනට පූර්ව දිනයක් වන්නේ නම් පමණකි.

9. *පුහුණු කිරීම.*– පුහුණුව අඛණ්ඩව පවත්වනු ලබන ක්‍රියාවලියකි. සේවයට පිවිසෙන නිලධාරීන්ට සේවයේ වෘත්තීය පරිණතභාවය, පරිපාලනමය වගකීම සහ ඒවායේ වෘත්තීය අභිවර්ධන අවශ්‍යතා එමගින් ලබා දෙනු ඇත. පුහුණුව, ආධුනික පුහුණුව සහ සේවාස්ථ පුහුණුව යනුවෙන් දෙආකාරය.

(1) *ආධුනික පුහුණුව.*–

(අ) ආධුනික පුහුණුව ලේකම් විසින් සංවිධානය කොට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ හෝ වෙනත් උසස් පුහුණු කිරීමේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක් මගින් පවත්වනු ලබන රාජ්‍ය පරිපාලන පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් කරා යොමු වූ පාඨමාලාවකි. සේවයේ ස්ථිර කිරීම සඳහා මෙම පුහුණු සහතිකය ලබාගත යුතුය ;

(ආ) පුහුණු කාලසීමාව තුළ දී ආධුනික නිලධාරීන් කළමනාකාරීත්ව ක්‍රමෝපායන් හා නිපුනතා අත්කර ගැනීමට සහාය වනු ඇත. ඔවුන්ට සිංහල හා දෙමළ යන රාජ්‍ය භාෂා දෙක සහ සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාවෙහි ප්‍රවීණත්වය ලබා ගැනීමට පුහුණුව මගින් සහාය වනු ලැබේ. එමෙන්ම තමන් කළමනාකරුවන් වශයෙන් කටයුතු කිරීමට අපේක්ෂිත සමාජ, ආර්ථික හා සංස්කෘතික පරිසරයෙහි ඇතිවන සංවර්ධන ප්‍රවණතා පිළිබඳව ඔවුන්ට අවබෝධ කර දෙනු ලැබේ;

(ඇ) පුහුණු කාලය තුළ දී ආධුනික නිලධාරීන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත අනුයුක්ත කරනු ලබන අතර ඔවුන් එම ආයතනයේ අධීක්ෂණයට හා පාලනයට යටත් වන්නේ ය ;

(ඇ) 5(1) උප වගන්තියේ දැක්වෙන ක්‍රමය තුළින් සේවයට පිවිසෙන ආධුනික නිලධාරියකු ආධුනික පුහුණුව අවසානයේ දී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් නොවුවහොත් එම නිලධාරියාගේ සේවය අවසන් කළ යුතුය. 5 (2) උප වගන්තියේ දැක්වෙන ක්‍රමය තුළින් සේවයට පිවිසි ආධුනික නිලධාරියකු පුහුණුව අවසානයේ දී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් නොවුනහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයේ කලින් දරන ලද තනතුරට ආපසු යැවිය යුතු ය.

(2) *සේවාස්ථ පුහුණුව .–*

(අ) සේවාස්ථ පුහුණුව මගින් නිලධාරීන්ට වෘත්තීය පරිනතභාවය අඛණ්ඩව ලබා දෙනු ඇත. සේවයේ ස්ථර හතරට පැවරෙන පරිපාලන වගකීම් සහ ඒවායේ වෘත්තීය අභිවර්ධන අවශ්‍යතා මෙම පුහුණු පාඨමාලා මගින් ලබාදෙනු ඇත.

(i) ඉදිරිපෙළ කළමනාකරණ මට්ටමේ පුහුණු අවශ්‍යතා :
මෙම පුහුණුව III පන්තියේ නිලධාරීන්ට අදාළ වේ. මෙය ලේකම් විසින් අනුමත කරනු ලබන පාඨමාලා පහකින් සමන්විතය ;

(ii) මධ්‍යම කළමනාකරණ මට්ටමේ පුහුණු අවශ්‍යතා:
මෙම පුහුණුව II පන්තියේ නිලධාරීන්ට අදාළ වේ. මෙය ලේකම් විසින් අනුමත කරනු ලබන පාඨමාලා තුනකින් සමන්විතය ;

(iii) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පුහුණු අවශ්‍යතා:
මෙය I පන්තියේ නිලධාරීන්ට අදාළ වේ. මෙය ලේකම් විසින් අනුමත කරනු ලබන පාඨමාලා තුනකින් සමන්විත වේ.

(iv) ප්‍රතිපත්ති මට්ටමේ පුහුණු අවශ්‍යතා :
මෙය විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්ට අදාළ වේ.

(ආ) ශ්‍රී. ලං. ප. සේ සියළුම නිලධාරීන් ලිත් වර්ෂයක් තුළ දී අවම වශයෙන් සති දෙකකවත් පුහුණු පාඨමාලා හැදෑරිය යුතු වේ.

(ඇ) ඉහත ඡේදයේ සඳහන් වන පුහුණු පාඨමාලාවලට අමතරව සේවාවට අදාළ විෂයයන් සම්බන්ධයෙන් ලේකම් විසින් ශ්‍රී ලංකා සංවර්ධන පාරිපාලන ආයතනය මගින් වැඩමුළු, සම්මන්ත්‍රණ හා දේශන ආදිය ද සංවිධානය කරනු ලැබේ.

*10. ස්ථිර කිරීම.–*

(1) විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III පන්තියට පත් කරනු ලබන නිලධාරියකු වසර 03ක පරිවාස කාලයකට යටත් වේ. ඔහු/ඇය පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම්, ඔහු/ඇය පරිවාස කාලය අවසානයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ස්ථිර කරනු ලැබේ ;

(2) සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත III වන පන්තියට පත් කරනු ලබන නිලධාරියකු එක් වසරක වැඩබැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ඇය වැඩ බැලීමේ කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම්, වැඩ බැලීමේ කාලය අවසානයේ දී, ශ්‍රී. ලං. ප. සේ සේවයේ ස්ථිර කරනු ලැබේ. මෙම නිලධාරීන් පරිපාලන සේවයට පත් කිරීමෙන් අනතුරුව ලබන තුන්වන වැටුප් වර්ධකය උපයා ගැනීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

*11. භාෂා ප්‍රවීණතාවය .–*

(i) සේවයට පත් කරනු ලැබූ නිලධාරියෙකු පත්වීමේ දින සිට වසර හයක් ඇතුලත ඔහු/ඇය දෙවන භාෂාව පිළිබඳ විභාගයකින් සමත්විය යුතු ය. නිලධාරියෙකු අ.පො.ස. (සා. පෙ.) විභාගයේ දී අදාල භාෂා විෂයය සඳහා වන වෛකල්පිත භාෂා ප්‍රශ්ණ පත්‍රය සමත්වීමෙන් හෝ ඔහු/ඇය දෙවැනි භාෂා පරීක්ෂණයෙන් සමත්වීමෙන් අදාල විෂයය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ii) සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු සම්බන්ධයෙන් දෙවන භාෂාව දෙමළ භාෂාව වන අතර දෙමළ මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු සම්බන්ධයෙන් දෙවන භාෂාව සිංහල භාෂාව වේ. ඉංග්‍රිසි භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියකු ඔහු/ඇය සිංහල හා දෙමළ යන භාෂා දෙක පිළිබඳ පරීක්ෂණවලින් සමත් විය යුතුය.

12. *කාර්යක්ෂමතා කඩඉම.–*

(i) සේවයේ III පන්තියට පත්කරනු ලබන නිලධාරියකු සේවයට පත්වීමේ දින සිට වසර තුනක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. මෙම විභාගයේ විෂයය නිර්දේශ "ඇ" පරිශිෂ්ඨයේ දක්වා ඇත.

(2) සේවයේ III පන්තියේ නිලධාරියකු සේවයට පත්වීමේ දින සිට වසර 06ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතුය. මෙම විභාගය විෂයය නිර්දේශ " ඇ " පරිශිෂ්ඨයේ දක්වා ඇත.

සටහන .– කාර්යක්ෂමතා කඩඉම් විභාග වර්ෂයකට දෙවතාවක් පවත්වනු ලැබේ.

*13. පන්තියට පත් කිරීම. –*

(1) මෙම ඡේදයේ (2) හෝ 3(අ) යටතේ II පන්තියට උසස් කිරීම සඳහා යම් නිලධාරියකු විසින් පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුයි :

(i) නියමිත දිනට පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වී තිබීම ;

(ii) දෙවන භාෂාව සමත් වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර තිබීම;

(iii) ඔහු/ඇයගේ උසස් වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ නියමිත දිනයන්හි දී සියළු වැටුප් වර්ධක උපයා ගෙන තිබීම;

(iv) ඔහු/ඇයගේ උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ සිදු කළ කිසියම් වරදක් සම්බන්ධයෙන් විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබීම;

(v) 9(2) අ (1) උපඡේදය යටතේ නියමිත පුහුණු පාඨමාලා සංඛ්‍යාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

(vi) ඔහු/ඇය II පන්තියේ උසස්වීමක් සඳහා සුදුසුකම් ලැබූ දිනට පූර්වාසන්න වූ වසර 05ක කාලසීමාව තුළ ඔහුගේ/ඇයගේ වාර්ෂික කාර්ය සාධන ඇගැයීම් වාර්තාවන් හි "සතුටුදායක" මට්ටමට ඉහළ කාර්යඵල මට්ටමක් ලහා කර ගෙන තිබීම.

(2) යම් වර්ෂයක සේවයේ II පන්තියේ පවත්නා පුර්ප්පාඩුවලින් 80% ක් සඳහා පත් කිරීම, තරඟ විභාගයක ප්‍රතිඵල මත මුළු ලකුණු වලින් 50% කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගන්නා අයදුම්කරුවන් අතුරෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. සේවයේ සථිර කරන ලද III පන්තියේ වසර 06කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට මෙය සීමා වේ.

විභාගයට අයදුම්කිරීමේ ක්‍රමය *ගැසට් පත්‍රයේ* පළ කරනු ඇත.

(3) (අ) යම් වර්ෂයක සේවයේ II පන්තියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 20% ක් සඳහා බඳවා ගැනීම රා.සේ. කො. විසින් ඒ සඳහා පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය යෙදෙන මාසයට පූර්වාසන්නයෙන්ම වූ මාසයේ අවසාන දිනට සේවයේ III පන්තියේ සේවයේ ස්ථිර කරන ලද, එම පන්තියේ වසර 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු සේවයේ II පන්තියට පත් කිරීම සඳහා සලකා බැලීම පිණිස සුදුසුකම් ලබයි.

(ආ) යම් නිලධාරියෙකු 13/(3) අ උපඡේදයේ ප්‍රකාර II පන්තියට උසස් කිරීම සඳහා 13(3) (අ) උපඡේදයේ සඳහන් අවශ්‍යතාවයන්ට අතිරේකව ඔහු/ඇය පිළිගත් විශ්ව විද්‍යාලයක /ආයතනයක රාජ්‍ය පරිපාලනය, කළමණාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති. ආර්ථික හා සමාජ සංවර්ධනය යන විෂයයන් ක්ෂේත්‍රයකට අදාලව හෝ ඒ හා සමාන සුදුසුකමක් වශයෙන් රා. සේ.කො. විසින් පිළිගන්නා ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

(4) ඉහත(13) ( I ) උප ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන නිලධාරීන් තම අයදුම්පත්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව අදාළ අමාත්‍යාංශයේ ලේකම් මගින් ඉදිරිපත් කළ යුතු වේ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන උපදෙස්වලට අනුකූලව අයදුම්පත්‍රය සකස් කළ යුතුය.

14. 1 *පන්තියට පත් කිරීම.–*

( i ) සේවයේ I පන්තියේ පුරප්පාඩුවලට පත් කිරීම පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කරන ලද සේවයේ II වන පන්තියේ නිලධාරීන් උසස් කිරීම මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ :

(අ) II පන්තියේ අවම වශයෙන් වසර හතක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

(ආ) I පන්තියට උසස් කිරීමට සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වූ වසර පහක කාලසීමාව තුළ ඔහු/ඇය තම වාර්ෂික කාර්ය් සාධක ඇගයීම් වාර්තාවන්හි "සතුටුදායක " මට්ටටම ඉහළ මට්ටමින් ලබා ගෙන තිබීම;

(ඇ) 9(2) අ( II ) උපඡේදය යටතේ නියමිත පුහුණු පාඨමාලා සංඛ්‍යාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;

(ඈ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද රාජ්‍ය පරිපාලනය කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති ආර්ථික හා සමාජ සංවර්ධන යන විෂය ක්ෂේත්‍රයන්ට අදාලව හෝ ඒ හා සමාන සුදුසුකමක් වශයෙන් රා.සේ. කො. විසින් පිළිගන්නා ලද ශාස්ත්‍රපති හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(2) රා. සේ. කො. විසින් පත් කරනු ලබන ලේකම් සහ තවත් අමාත්‍යාංශ ලේකම්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත තේරීම් මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාවය මත පදනම්ව කරනු ලබන නිර්දේශ මත, මෙම පන්තියට පත් කිරීම සඳහා වන නිර්දේශයන් ඉදිරිපත් කෙරෙනු ඇත. මෙම කාර්යය උදෙසා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් නොඉක්මවන්නා වූ II පන්තියේ නිලධාරීන් සංඛ්‍යාවක් මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කළ යුතුය.

15. *විශේෂ ශ්‍රේණියට පත් කිරීම.–*

(I) විශේෂ ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩුවලට පත් කිරීම සේවයේ I පන්තියේ සිටින පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කරන ලද නිලධාරීන් උසස් කිරීම් මගින් රා.සේ. කො. විසින් සිදු කරනු ලැබේ :

(අ) සේවයේ I පන්තියට අයත් අනුමත තනතුරක වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;
(ආ) 9(2) අ(iii) උප ඡේදය යටතේ නියමිත පුහුණු පාඨමාලා සංඛ්‍යාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම;
(ඇ) විශේෂ ශ්‍රේණියට සුදුසුකම් ලැබීමට පූර්වාසන්න පත් අවුරුදු කාලය තුළදී වාර්ෂික කාර්ය සාධන ඇගැයීම් වාර්තාවන්හි "සතුටුදායක " මට්ටමට ඉහළ මට්ටමක් ලබා තිබීම;
(ඈ) 14 (I) ඈ ඡේදයේ සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම.

(2) රා. සේ. කො. විසින් පත් කරනු ලබන සාමාජිකයින් තුන්දෙනෙකු ගෙන් සමන්විත තේරීම් මණ්ඩලයක් මගින් කරනු ලබන ඇගැයීමකින් පසුව විශේෂ ශ්‍රේණියට පත් කිරීම සඳහා වන නිර්දේශයන් ඉදිරිපත් කෙරෙනු ඇත. තම නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා මණ්ඩලය විසින් නිලධාරීන්ගේ කුසලතාවය සහ ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳ සමස්ථ ඇගැයීම පදනම් කරගනු ඇත. මෙම කාර්ය උදෙසා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් නොඉක්මවන්නාවූ I පන්තියේ නිලධාරීන් සංඛ්‍යාවක් මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ යුතුය.

16. *ස්ථාන මාරු හා පත් කිරීම්–* සේවයේ සෑම නිලධාරියෙකුම ස්ථාන මාරුවලට යටත්වන අතර, දිවයිනේ කවර ප්‍රදේශකයට වුවද ස්ථාන මාරු කරනු ලැබිය හැකි ය. එක් එක් නිලධාරියාගේ විශේෂ කුසලතා ඔහු/ඇය පූර්ව සේවා පළපුරුද්ද පුහුණුව හා අනාගත වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍ය රැකියා පළපුරුද්ද යනාදි කරුණු වලට ගැලපෙන මාරු කිරීමේ ක්‍රමයක් ලේකම් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව පිළියෙළ කළ යුතුය.

17. *අන්තර්කාලීන විධිවිධාන .–*

(අ) II පන්තිය සඳහා වන වර්තමාන උසස්වීම් ක්‍රමය 2005.12.31 දක්වා පවත්වනු ලැබේ.

(1) ව්‍යවස්ථාව රජයේ ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට සිව් වසරක් ඉක්ම ගිය පසුව 14 හා 15 යන ඡේදයන්හි සඳහන් වන උස්සවීම් ක්‍රම පූර්න වශයෙන් ක්‍රියාත්මක විය යුතුය.

(2) එසේ වුවද එම අවුරුදු 04ක කාලය තුළ උසස්වීම් පහත සඳහන් පරිදි සිදුකළ යුතුය.

(අ1) II පන්තියට උසස් කිරීම් වලින් 50%ක් : අන්තර්කාලය තුළ සේවයේ අවුරුදු 10ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියෙකු II පන්තියේ උසස්වීම් සඳහා ඔහු/ඇය –